# ඉන්ද්‍රිය ධර්ම විසි දෙකː පෙළ හා අටුවා ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක්

චානක ප්‍රදීප් කරුණාරත්න[1], මැදගම්පිටියේ විජිතධම්ම හිමි[2]

## Abstract

The Buddha taught that, in addition to the five primary senses eye, ear, nose, tongue, and body—there are other faculties known as indriyas, which dominate or govern the dhammas associated with them. To "dominate" means that these faculties control and determine the functioning of related phenomena. Because the eye, for example, governs the dhammas related to visual perception, it is called an indriya. In this sense, each faculty can be understood as a kind of dhamma deity a principle or power governing specific experiences.

While these faculties are termed "deities" metaphorically, from the perspective of ultimate reality (paramattha dhamma), they are nothing more than specific dhammas. The five physical senses represent the base of sensation (vedanā), while the mental faculties such as feeling, wisdom, and the life faculty are categorized as mental dhammas. Specifically, the five sense faculties, the life faculty, and various associated mental factors like feeling, perception, volition, concentration, mindfulness, and wisdom, collectively amount to sixteen faculties as dhammas.

People who do not understand these ultimate realities and the workings of these faculties often mistakenly believe that actions and experiences arise from an inner soul or self. Some even assume that the faculties themselves are the soul. In truth, understanding the nature and functioning of these faculties leads to the realization that no permanent soul exists as the world imagines. The Buddha taught about these "sense deities" precisely to free beings from this delusion of self. The eye, ear, nose, tongue, and body are not expressions of a soul; they are impersonal faculties operating within the causal processes of dependent origination.

**Keywords**: *Pannindriya, Analysis, Indian Dharma, Holding the Supreme Authority, Paramartha Dharma*

---

1 Faculty of Graduate Studies, University of Sri Jayewardenepura.

2 Department of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura.

## හැඳින්වීම

ඉන්ද්‍රිය ධර්ම විසි දෙකඃ පෙළ හා අටුවා ඇසුරෙන් අධ්‍යයනය කිරීම මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණයි. එහිදී ඉන්ද්‍රිය යනු කුමක්ද? ඉන්ද්‍රිය සම්බන්ධව ඇති ප්‍රභේද මොනවාද? දෙවිසි ඉන්ද්‍රිය වර්ගීකරණය හා නිර්වාණය අතර ඇති සම්බන්ධය කුමක්ද? විසි දෙකක් වූ ඉන්ද්‍රිය ධර්මයන් මගින් ලොකෝත්තරත්වය කරා ගමන් කිරීමට උපකාර වන්නේ කෙසේද? යන්න මෙහි සාකච්ඡා වෙයි. ඉන්ද්‍රිය පිළිබඳව නිර්වචන රාශියකි. බුදුදහමෙහි එන මූලික ධර්ම කාණ්ඩ අතරින් ඉන්ද්‍රිය ධර්ම විසිදෙක සුවිශේෂී ස්ථානයක් ගනී. ඉන්ද්‍රිය යනු අධිපතිභාවය හෝ ප්‍රමුඛත්වය යන අර්ථය දෙන පදයකි.

යම්කිසි ධර්මතාවයක ප්‍රමුඛත්වය බලපෑම් සහගත බව හෝ ආධිපත්‍යය විදහාලන අවස්ථාවලදී එය ඉන්ද්‍රිය ධර්මයක් ලෙස හඳුන්වයි. මෙම ඉන්ද්‍රිය ධර්මයන් පුද්ගලයාගේ භෞතික, මානසික හා අධ්‍යාත්මික පැවැත්මට මූලික වශයෙන් බලපාන අතර, ඒවා නුවණින් විමසීමෙන් ලෝක ස්වභාවය අවබෝධ කර ගැනීමටත්, දුකින් මිදීමටත් මග පෙන්වයි. අභිධර්මයට අනුව මේවා වර්ගීකරණය කර ඇත.

මෙහිදී ඉන්ද්‍රිය විභාගය හා සම්බන්ධ විවිධ ව්‍යුහ යටතේ කරුණු ගොනු වෙයි. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පංචස්කන්ධය හා සම්බන්ධ ඉන්ද්‍රිය ධර්ම පිළිබඳ විවිධ කරුණු මෙහිදී සාකච්ඡා වෙයි. පංචස්කන්ධය පිළිබඳ පුළුල් විග්‍රහයක් ත්‍රිපිටක සූත්‍රයන්හි ඇතුළත් ය. එහි දැක්වෙන ඉන්ද්‍රිය ධර්ම විසි දෙක පෙළ හා අටුවා ඇසුරෙන් ප්‍රාමාණික විග්‍රහයක් සිදුකිරීමට මෙහිදී අපේක්ෂිතය.

## පර්යේෂණ ගැටලුව

පෙළ හා අටුවා ඇසුරෙන් ඉන්ද්‍රිය ධර්ම විසි දෙක පිළිබඳව දත හැකි විවරණ මොනවාද? ඉන්ද්‍රිය ධර්ම විසි දෙක නිර්වාණ සාධනයට කෙතෙක් දුරට උපකාරී වේද? යන්න අධ්‍යයනය මෙම පර්යේෂණයෙහි ප්‍රධාන ගැටළුව වෙයි.

**පර්යේෂණ අරමුණු**

ප්‍රධාන අරමුණ

- ඉන්ද්‍රිය සංකල්පය විවිධ විෂයීය සන්දර්භවල යෙදී ඇති අයුරු ත්‍රිපිටක මූලාශ්‍රය ඇසුරින් සොයා බැලීම

සෙසු අරමුණු

- ඉන්ද්‍රිය පද්ධතිය ආශ්‍රිත බෞද්ධ ඉගැන්වීම් හුවා දැක්වීම
- පාලි මූලාශ්‍රයෙහි ඉන්ද්‍රිය ගණනින් කෙතෙක්ද යන්න සොයා බැලීම
- නිර්වාණගාමී ප්‍රතිපදාව තුල ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරීත්වය සොයා බැලීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි ලා භාවිත කෙරුණේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමයයි. ප්‍රධාන වශයෙන් පාලි ග්‍රන්ථ හා අටුවා පරිශීලනයෙන් මෙම පර්යේෂණය සිදුකරන ලද අතර ද්විතීයික මූලාශ්‍රය ද පරිශීලනය කෙරිණ. මූලාශ්‍රය භාවිතය සඳහා පුස්තකාලය හා අන්තර්ජාලය ද පරිහරණය කරන ලදි.

**සාහිත්‍ය විමර්ශනය**

ඉන්ද්‍රිය යන වචනය පිළිබඳව අර්ථකථන දැක්වීමේදී විභඞ්ගප්පකරණ අටුවාව හා විභඞ්ගප්පකරණ මූලටීකාව ද ශබ්දකල්පද්‍රැම, වචස්පත්‍යම්, ශබ්දස්තෝමමහානිධි ආදී ශබ්දකෝෂ ද ප්‍රාථමික මූලාශ්‍රය අතරට එයි. විභංගප්පකරණ අටුවාවෙහි ආධිපත්‍ය අර්ථයෙන් ද ඓශ්වර්ය අර්ථයෙන් ද ඉන්ද්‍රිය ශබ්දය අර්ථ ගන්වා ඇත. මෙමඟින් බුද්ධඝෝෂ හිමි වෛදික සාහිත්‍යාගත විවරණ ආශ්‍රයෙන් ඉන්ද්‍රිය ශබ්දය විවරණය කිරීමට උත්සාහ දරා ඇති බව පෙනේ. විභඞ්ගප්පකරණ මූල ටීකාවෙහි ඉන්ද්‍ර හෝ ඉන්ද්‍රගේ අවයව යන අර්ථයෙන් ඉන්ද්‍රිය අර්ථ ගන්වා තිබේ.

බෞද්ධ විශ්වකෝෂයේ ඉන්ද්‍රිය සංකල්පය උපාලි කරුණාරත්න මහතා විසින් කරන ලද විස්තරයෙකි. දෙවිසි (22) ඉන්ද්‍රියයන් හැඳින්වීම සඳහා පොදුවේ ප්‍රපඤ්ච (Phenomena) යන වචනය භාවිත කොට ඇති අයුරු මෙහිදී දැකගත හැකිය. ඉන්ද්‍රියයන් ලෞකික හා ලොකෝත්තර ලෙස කොටස් දෙකකට බෙදා මෙහි දක්වා ඇති අතර, බුද්ධඝෝෂ හිමියන්ගේ විවරණ අනුව විග්‍රහ කොට ඇති බවක් දක්නට ලැබේ.

2012 වර්ෂයේ අභය මුද්‍රණ ශිල්පියෝ විසින් මුද්‍රිත සුමනපාල ගල්මංගොඩ මහතා විසින් රචිත ආදි බෞද්ධ දර්ශනය සුවිශේෂී ග්‍රන්ථයක් වෙයි. එහි ඉන්ද්‍රිය පිළිබඳ විවිධ වූ ප්‍රභේද දක්වයි. දෙවිසි ඉන්ද්‍රිය හා සම්බන්ධ විග්‍රහයන් මෙහිදී පෙන්වා දෙයි. පෙළ දහමෙහි එන කරුණු මෙහිදී ඉස්මතු කොට දැක්වීමට වෙර දරා ඇත. 1995 වර්ෂයේ අසංග තිලකරත්න මහතා විසින් සංස්කරණය කෙරුණු අභිධර්ම අධ්‍යයනය කෘතිය ද ඉන්ද්‍රිය පිළිබඳ ආභිධම්මික මතවාද රාශියක් ඉස්මතු කරගත හැකි කෘතියකි. අභිධර්මයේ ඇති සෑම කාරණයක්ම ඉන්ද්‍රිය බද්ධ වූ ඒවා ලෙස විස්තාරිතව ඇති අයුරු මනාව පෙන්වා දී ඇත. පංච ඉන්ද්‍රියන් වැඩෙන අයුරු හා දමනය වන අයුරු මෙහි මනාව පෙන්වා දී ඇත.

2007 වර්ෂයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ගුණපාල ධර්මසිරි මහතා විසින් රචිත දාර්ශනික ප්‍රශ්න ග්‍රන්ථය මගින් දාර්ශනික ප්‍රශ්න මනාව පෙන්වා දී ඇත. දාර්ශනික ප්‍රශ්න අතර ඉන්ද්‍රිය පිළිබඳව ඇති ගැටලු සුවිශේෂ අයුරින් මෙහිදී විග්‍රහ කොට පෙන්වා දෙයි. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය විසින් ප්‍රකාශිත හේනේපිටගෙ දර ඤාණසීහ හිමියන් විසින් රචිත බෞද්ධ දර්ශනය ග්‍රන්ථය " ඉන්ද්‍රිය" හා සම්බන්ධ සුවිශේෂී කරුණු කාරණා ඇතුළත් ග්‍රන්ථයකි. සමස්තයක් ලෙස ගත්කල එහි ඇති සියලුම කාරණා ඉන්ද්‍රිය බද්ධ වූ ඒවා බව පෙනේ. එසේම 1980 වර්ෂයේ වීල් ප්‍රකාශන ආයතනයේ මුද්‍රිත එඩ්වට් කොන්සේ විසින් රචිත The Way of Wisdom: The Spiritual Faculties යන ග්‍රන්ථය ද ඉන්ද්‍රිය හා සම්බන්ධ ආධ්‍යාත්මික හැකියාවන් හෙළිදරව් කරයි. මෙමගින් ද පංච ඉන්ද්‍රිය හා දෙවිසි ඉන්ද්‍රිය වර්ගීකරණයන් පිළිබඳව දත හැකිය.

1997 වර්ෂයේ තනිස්සරෝ හිමියන් විසින් පරිවර්තනය කරන ලද Indriya Vibhanga Sutta: Analysis of the Mental Faculties යන්නද ඉන්ද්‍රිය විභංග සූත්‍රය ඇසුරෙන් මානසික ධර්ම විශ්ලේශණය කරන්නකි. එම ධර්ම අතර පංච ඉන්ද්‍රිය පිළිබඳව කරන විශ්ලේෂණය සුවිශේෂය.

**සාකච්ඡාව**

ඉන්ද්‍රිය පිළිබඳ අර්ථ විග්‍රහය

'ඉන්ද්‍රිය' යනු බුදුදහමේ ඇතුළත් විශේෂ ඉගැන්වීමකි. තමා හා සම්බන්ධ ධර්මයන් කෙරෙහි අධිපතිකම පවත්වන දේ (ධර්මයෝ) ඉන්ද්‍රිය නම් වෙති. අධිපතිකම පැවැත්වීම යනු තමාට අනුකූල කරවා ගැනීම ය. අනෙකුත් චෛතසිකයන්ට වඩා ප්‍රබල එසේ ම අන් චෛතසිකයන්ද පාලනය කිරීමේ හැකියාවක් සහිත මනෝධර්මීය සාධක වශයෙන් ද මෙම ඉන්ද්‍රිය ධර්මයන් හැඳින්විය හැකිය. (අග්ගවංස හිමි, 2015, පිටුව 333) බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලින් නිර්දේශිත පරම නිෂ්ඨාව වන නිර්වාණය අවබෝධ කිරීම සඳහා ඉන්ද්‍රිය සංවරය නැතහොත් දමනය අත්‍යවශ්‍ය වෙයි. එමෙන්ම ඒ සඳහා සංවර්ධනය කරගත යුතු ඉන්ද්‍රිය ද වේ. දමනය කළ යුත්තේ චක්ඛු (ඇස), සෝත (කන), ඝාණ (නාසය), ජිව්හා (දිව), කාය (ශරීරය), මන (සිත) යන ඉන්ද්‍රිය හය යි. වැඩිය යුත්තේ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රියයන් ය. මේ සියල්ලද ඇතුළත්ව ඉන්ද්‍රිය විසි දෙකක් වේ. ( ධම්මානන්ද හිමි, 2018, පි. 108) චක්ඛුන්ද්‍රිය, සෝතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, මනින්ද්‍රිය, සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සෝමනස්සින්ද්‍රිය, දෝමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය වශයෙනි.

ඉන්ද්‍රිය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි ව්‍යුහාත්මක සන්දර්භ කිහිපයක් ඇති බව පෙනේ. අනෙක් අතට ඒ ඉන්ද්‍රියයන් විෂයයීය වශයෙන් ද විවිධ වේ. පඤ්ච ඉන්ද්‍රිය යන්න දෙපරිදිව විෂයයීය වශයෙන් වෙන් වෙයි. චක්ඛුන්ද්‍රිය, සෝතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය යන පස සේ ම සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය

යන පස ද පඤ්ච ඉන්ද්‍රිය ම වේ.

වෛදික ආගමික ඉගැන්වීම් අනුව සියලු දෙයෙහි නිර්මාපකයා ඉන්ද්‍ර දෙවියාය. වෛදික හා බ්‍රාහ්මණ සාහිත්‍ය තුළ ඉන්ද්‍රිය සංකල්පය ආත්මය පිළිබඳ දැනුම පහළ කරවන ඥානෝපකරණයක් වශයෙන් ව්‍යවහාර වේ.

අන්‍ය දර්ශනයන්හි ඉන්ද්‍රිය සංකල්පය ඒකාංශිකව විග්‍රහ කොට ඇති නමුත් බුදුසමයෙහි දක්වෙන්නේ ඉන්ද්‍රිය සංකල්පයේ පරිණත අවස්ථාවකි. "රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පංචස්කන්ධයේ ඇලුණු පුද්ගලයා සත්ත හෙවත් සත්ත්ව නම් වෙයි. සද්ධා විරිය සති සමාධි පඤ්ඤා යනුවෙන්ද ඉන්ද්‍රිය පහකි. උසස් ඉන්ද්‍රියෙන් යුක්ත පුද්ගලයා 'පර' ලෙස හඳුන්වයි. පහත් ඉන්ද්‍රියෙන් යුක්ත පුද්ගලයා 'අපර' නම් වේ. බුදුරජාණන් වහන්සේ 'පරොපර' ලෙස හඳුන්වයි (රාහුල හිමි, 2002, පි. 34)

බුදුරජාණන් වහන්සේගේ ඤාණයන් අතර ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණය සුවිශේෂ වෙයි. (මජ්ඣිම නිකාය 11, 2006, පි. 738) එම ඤාණය මඟින් සත්ත්වයන්ගේ ශ්‍රද්ධා, වීර්ය ආදී ඉන්ද්‍රිය ධර්මයන්ගේ දියුණුව හා පරිහානිය පිළිබඳව අවබෝධ වෙයි. ලොවෙහි වසන සියලු සත්වයින්ගේ අන්‍ය ඕනෑම පුද්ගලයෙකුගේ ශ්‍රද්ධා, වීර්යය, සති, සමාධි, ප්‍රඥා යන ඉන්ද්‍රිය ධර්මයන් දියුණු වී ඇති බව හෝ නොමැති බව දැනගන්නා ඥානය ඉන්ද්‍රිය පරෝ පරියත්ත ඤාණයයි. මෙම ඤාණය පිළිබඳව ඉන්ද්‍රිය විභංග ප්‍රකරණයේ විග්‍රහ කොට පෙන්වා දී ඇත.

පුද්ගලයාගේ ලෞකිකත්වය කෙරෙහි ඍජුව බලපාන සංකල්පයකි ඉන්ද්‍රියග ඉන්ද්‍රිය පිණවීම මගින් පුද්ගලයා ලෞකික දියුණුව සලසා ගනී. බුදුසමය එය අනුමත නොකරන බවක් පෙනී යයිග නිර්වාණ සාධනය සඳහා ඉන්ද්‍රිය දමනය අත්‍යවශ්‍ය සාධකයකි. එම නිසා ඉන්ද්‍රිය කෙරෙහි බුදුදහම දැඩි අවධානයක් යොමු කිරීම සාධාරණයග

**දෙවිසි ඉන්ද්‍රිය ධර්ම**

ඉන්ද්‍රිය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි ව්‍යුහාත්මක සන්දර්භ කිහිපයක් ඇති බව පෙනේ. අනෙක් අතට ඒ ඉන්ද්‍රියයන් විෂයයීය වශයෙන් ද

විවිධ වේ. පඤ්ච ඉන්ද්‍රිය යන්න දෙපරිදිව විෂයයීය වශයෙන් වෙන් වෙයි. චක්ඛුන්ද්‍රිය, සෝතින්ද්‍රිය, ඝානින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය යන පස සේ ම සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පස ද පඤ්ච ඉන්ද්‍රිය ම වේ (ගාමච්චි, 2006, පි. 56). ඒ අනුව පෙනීයන්නේ ඉන්ද්‍රිය පිළිබඳ විෂයීය විග්‍රහයකින් ඒ පිළිබඳ මූලධර්ම හා ඒවායේ අන්තර් සම්බන්ධය හඳුනාගත හැකි බව යි. එම දෙවිසි ඉන්ද්‍රියයන් පහත පරිදි දැකගත හැකි වෙයි.

01. චක්ඛුන්ද්‍රිය

චක්ඛුන්ද්‍රිය යනු චක්ෂුඃ ප්‍රසාද රූප ය. එය චක්ෂුර් විඥානයට අධිපති ය. චක්ෂුර් විඥානයට ඇතිවිය හැක්කේ චක්ෂුඃ ප්‍රසාදය අනුවය. චක්ෂුඃ ප්‍රසාදය බොහෝ දීප්තිමත් වන කල්හි එයට අනුව රූපය හොඳින් දක්නා චක්ෂුර් විඥානයක් ඇති වේ. චක්ෂුඃ ප්‍රසාදයේ දීප්තිය අඩු වුවහොත් එයට අනුව අරමුණ හොඳින් නො දක්නා චක්ෂුර් විඥානයක් ඇති වේ. ඇසේ දෝෂ ඇති කල්හි ඇති සැටියට නො පෙනී වස්තූන් කුඩා වී හෝ මහත් වී හෝ පැහැය වෙනස් වී හෝ පෙනෙන්නේ චක්ෂුර් විඥානය චක්ෂුඃ ප්‍රසාදයට අනුකූලව ඇති වන නිසා ය (කුලසූරිය, 1999, පි. 169).

චක්ෂුර් විඥානයට චක්ෂුඃ ප්‍රසාදයේ ස්වභාවය ඉක්මවා එයට අනුකූල නො වී ඇති විය නො හැකි ය. චක්ෂුර් විඥානය තමාට අනුකූල කරවන නිසා චක්ෂුඃ ප්‍රසාදය එක් ඉන්ද්‍රියයකි. "චක්ඛුන්ද්‍රියං, රූපදස්සනේ අධිපතිභාවං ගච්ඡති" රූපයන් දැකීමට අධිපති වේ යන අර්ථයෙන් මෙය චක්ඛුන්ද්‍රිය වන බව මහානිද්දේසයෙහි දැක්වේ.

02. සෝතින්ද්‍රිය

සොතින්ද්‍රිය යනු ශ්‍රෝත්‍ර ප්‍රසාදය ය. සෝතින්ද්‍රියං, සද්දසවණේ අධිපතිභාවං ගච්ඡති. සෝතින්ද්‍රිය ශබ්දයන් ඇසීමට අධිපති වේ. (මහානිද්දේස)

03. ඝානින්ද්‍රිය

ඝානින්ද්‍රිය ගන්ධයන් දැනීමට අධිපති වේ. ඝානින්ද්‍රියං, ගන්ධඝායතනේ අධිපතිභාවං ගච්ඡති. (මහානිද්දේස) ඝානින්ද්‍රිය යනු ඝ්‍රාණ ප්‍රසාදය ය.

04. ජිව්හින්ද්‍රිය

ජිව්හින්ද්‍රිය (දිව) රසයන් දැනීමට අධිපති වේ. ජිව්හින්ද්‍රියං, රසඝායතනේ අධිපතිභාවං ගච්ඡති. (මහානිද්දේස) ජිව්හින්ද්‍රිය යනු ජිහ්වා ප්‍රසාදය ය.

05. කායින්ද්‍රිය

කායින්ද්‍රිය යනු කාය ප්‍රසාදය ය. මේ ඉන්ද්‍රියයෝ සතර දෙන ද පිළිවෙළින් සෝත, ඝාන, ජිව්හා, කාය විඤ්ඤාණයන් කෙරෙහි අධිපති කම් කෙරෙති. කායින්ද්‍රිය (ශරීරය) ස්පර්ශයන් දැනීමට අධිපති වේ. කායින්ද්‍රියං, ඵොට්ඨබ්බඩුසනේ අධිපතිභාවං ගච්ඡති. (මහානිද්දේස)

06. ඉත්ථින්ද්‍රය

ඉත්ථින්ද්‍රිය (ස්ත්‍රී භාවය) ස්ත්‍රීත්වයට අධිපති වේ. යං ඉත්ථියා ඉත්ථිභාවෝ, තං ඉත්ථින්ද්‍රියං. (විභංග) ඉත්ථින්ද්‍රය යනු ස්ත්‍රීභාව රූපය ය.

07. පුරිසින්ද්‍රිය

පුරිසින්ද්‍රිය (පුරුෂ භාවය) පුරුෂත්වයට අධිපති වේ. යං පුරිසස්ස පුරිසභාවෝ, තං පුරිසින්ද්‍රියං. (විභංග) පුරිසින්ද්‍රිය යනු පුරුෂ භාව රූපය ය. භාව රූප ස්ත්‍රී ආකාරය හා පුරුෂාකාරය ගැන්වීම් වශයෙන් සම්පූර්ණ රූපයට අධිපතිකම කෙරේ. ස්ත්‍රී පුරුෂයින්ගේ අදහස්වල ද සිතිවිලිවල ද වෙනස් කමක් තිබේ. එයට හේතුවත් ස්ත්‍රී පුරුෂ ස්වභාව දෙක ම ය. එබැවින් සාමාන්‍යයෙන් පඤ්චස්කන්ධය කෙරෙහි ම භාව රූපයන්ගේ අධිපතිකම ඇති බව කිය යුතු ය.

08. ජීවිතින්ද්‍රිය

ජීවිතින්ද්‍රිය (ජීවිතය) ජීවිතය පවත්වාගෙන යාමට අධිපති වේ. ජීවිතින්ද්‍රියං ආයුපරිපාලනේ අධිපතිභාවං ගච්ඡති. (අට්ඨසාලිනී) ජීවිතින්ද්‍රිය රූප - අරූප වශයෙන් දෙවැදෑරුම් වේ. ජීවිතින්ද්‍රිය රූපය, රූප ජීවිතින්ද්‍රිය ය. ජීවිතින්ද්‍රිය චෛතසික ය, අරූප ජීවිතින්ද්‍රිය ය. ජීවිතින්ද්‍රිය රූපය කර්මජ රූපයන්ට ද, ජීවිතින්ද්‍රිය චෛතසිකය චිත්ත චෛතසිකයන්ට ද අධිපති බව කෙරේ. ඒ අධිපති බව කිරීම පරම්පරාව චිර කාලයක් පැවැත්වීම සම්බන්ධයෙනි.

09. මනින්ද්‍රිය

මනින්ද්‍රිය (මනස) අරමුණු දැනීමට අධිපති වේ. මනින්ද්‍රියං, ආරම්මණවිජානනේ අධිපතිභාවං ගච්ඡති. (ධම්මසංගණී) මනින්ද්‍රිය යනු සිත ය. ආරම්මණ විජානන ය සම්බන්ධයෙන් තමා හා එක් ව උපදනා ධර්මයන් කෙරෙහි සිත අධිපති කම් කරනු ලැබේ.

10. සුඛින්ද්‍රිය, 11. දුක්ඛින්ද්‍රිය, 12. සෝමනස්සින්ද්‍රිය, 13. දෝමනස්සින්ද්‍රිය, 14. උපෙක්ඛින්ද්‍රිය

මේ පස ධර්ම වශයෙන් එක ම වේදනා චෛතසිකය ය. එක ම වේදනා චෛතසිකය සුඛින්ද්‍රියාදි වශයෙන් ප්‍රභේදයට පැමිණෙන්නේ ආරම්මණ රසය විඳීමේ ආකාරයෙනි. සුඛ, දෝමනස්ස වේදනා දෙක ඉෂ්ටාකාරයෙන් ආරම්මණ රසය විඳී. දුක්ඛ, දෝමනස්ස වේදනා දෙක අනිෂ්ටාකාරයෙන් ආරම්මණ රසය විඳී. උපේක්ෂා වේදනා මධ්‍යස්ථාකාරයෙන් ආරම්මණ රසය විඳී. සුඛ වේදනාදීහු ඒ ඒ ආකාරයෙන් ආරම්මණ රසය විඳීමෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට අධිපති කම පවත්වති. සම්ප්‍රයුක්ත ධර්මයෝ යැයි සඳහන් කොට ඇත්තේ ඒ ඒ වේදනා හා බැඳී උපදනා චිත්ත චෛතසිකයන්ට ය.

සුඛින්ද්‍රිය සැප අත්විඳීමට අධිපති වේ. සුඛින්ද්‍රියං, කායිකං සුඛං වේදනං. දුක්ඛින්ද්‍රිය (දුක් වේදනාව) දුක අත්විඳීමට අධිපති වේ. දුක්ඛින්ද්‍රියං, කායිකං දුක්ඛං වේදනං. සෝමනස්සින්ද්‍රිය (සතුටු සිත්) මානසික සතුට අත්විඳීමට අධිපති වේ. සෝමනස්සින්ද්‍රියං චේතසිකං සුඛං වේදනං.

දෝමනස්සින්ද්‍රිය (නොසතුටු සිත්) මානසික දුක අත්විඳීමට අධිපති වේ. දෝමනස්සින්ද්‍රියං, චේතසිකං දුක්ඛං වේදනං. උපෙක්ඛින්ද්‍රිය (උපේක්ෂා වේදනාව) මධ්‍යස්ථ බව හෝ උපේක්ෂාව අත්විඳීමට අධිපති වේ. උපෙක්ඛින්ද්‍රියං, නේවසුඛා නේවදුක්ඛා වේදනං. මේ ආදී වශයෙන් ඉන්ද්‍රිය ධර්මයන් ඒ ඒ දෙයට අධිපති වන බව ධම්මසංගණියේ පෙන්වයි.

15. සද්ධින්ද්‍රිය

සද්ධින්ද්‍රිය (ශ්‍රද්ධාව) තථාගත ශාසනය කෙරෙහි පැහැදීමට අධිපති වේ. සද්ධින්ද්‍රියං, සද්ධාවිමොක්ඛං. (විභංග) සද්ධින්ද්‍රිය යනු ශ්‍රද්ධා චෛතසිකය යි. 9ශ්‍රද්ධාව නම් අවබෝධය හේතුකොටගෙන සිතෙහි උත්පාදනය කරගන්නා නිසැක බවය. එම නිසැක බව බුදුරජාණන් වහන්සේ පිළිබඳ ජනිත වන්නක් විය හැකිය. බුදුන් වහන්සේ පිළිබඳ ප්‍රසාදයට පත්වන්නා ධර්මය කෙරෙහිද ප්‍රසාදයට පත්වන බව ධර්මයෙහි කියැවේ. (අග්ගවංස හිමි, 2015, පිටුව 333) (ශ්‍රද්ධාව බුද්ධාදි වස්තුන්හි විශ්වාසය තැබීම සම්බන්ධයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන්ට අධිපති වේ යැයිද පැවසිය හැකිය.

16. විරියින්ද්‍රිය

විරියින්ද්‍රිය (වීර්යය) කුසල ධර්මයන් වැඩීමට අධිපති වේ. විරියින්ද්‍රියං, ආරද්ධවිරියං. (විභංග) විරියින්ද්‍රිය යනු වීර්ය චෛතසිකය යි. වීර්ය ක්‍රියාවෙහි නො පසු බැසීම සම්බන්ධයෙන් ද සම්ප්‍රයුක්ත ධර්මයන්ට අධිපති වේ.

17. සතින්ද්‍රිය
සතින්ද්‍රිය (සතිය) අරමුණෙහි සිහිය පිහිටුවීමට අධිපති වේ. සතින්ද්‍රියං, උපට්ඨිතසතිං. (විභංග) සතින්ද්‍රිය යනු ස්මෘති චෛතසිකය යි. ස්මෘතිය කළ යුත්ත ඉක්ම යා නො දීම සම්බන්ධයෙන් ද සම්ප්‍රයුක්ත ධර්මයන්ට අධිපති වේ.

18. සමාධින්ද්‍රිය

සමාධින්ද්‍රිය යනු ඒකග්ගතා චෛතසිකය ය. (විචිකිච්ඡා සහගත සිතේ ඒකාග්‍රතාව හැර) සමාධිය අරමුණෙහි මනාකොට පිහිටීම සම්බන්ධයෙන් ද සම්ප්‍රයුක්ත ධර්මයන්ට අධිපති වේ. සමාධින්ද්‍රිය (සමාධිය) සිත එකඟ කිරීමට අධිපති වේ. සමාධින්ද්‍රියං, අවික්ඛේපං. (විභංග)

19. පඤ්ඤින්ද්‍රිය

පඤ්ඤින්ද්‍රිය යනු ලෞකික සිත්වල ප්‍රඥාව ය. පඤ්ඤින්ද්‍රිය (ප්‍රඥාව) යථාභූත ඥානයට අධිපති වේ. පඤ්ඤින්ද්‍රියං, යථාභූතඤාණං. ( චන්දවිමල හිමි, 1997, පි. 43 ) (විභංග) මේ ධර්ම පසෙන් සමාධිය අරමුණෙහි මනාකොට පිහිටීම සම්බන්ධයෙන් ද, ප්‍රඥාව අරමුණේ සැටි දැන ගැනීම සම්බන්ධයෙන් ද සම්ප්‍රයුක්ත ධර්මයන්ට අධිපති කම් කරන්නේ ය.

20. අනඤ්ඤාතඤ්ඤාස්සාමිතින්ද්‍රිය

අනඤ්ඤාතඤ්ඤාස්සාමිතින්ද්‍රිය යනු සෝවාන් මාර්ග චිත්තයේ ප්‍රඥාව ය. අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය මම නොදත් දෙය දැනග න්නෙමි, යන සිතිවිල්ල ඇතිවීම, එනම් සෝවාන් මාර්ග ඥානයට පෙර ඇතිවන ප්‍රඥාවයි. සෝතාපත්තිමග්ගසමංගිස්ස ඤාණං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං. (විභංග) අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය යන වචනයේ තේරුම, නොදන්නා ලද්ද දැනගන්නට ඕනෑය කියා උත්සාහ කරනුයේ ඉන්ද්‍රිය ය යනුයි. පෙර කිසි කලෙක නොදත් චතුස්සත්‍ය ධර්මය හෝ නිවන දැන ගනිමිය යන උත්සාහයෙන් විදර්ශනා වඩන්නහුට ඒ උත්සාහය නිසා ඇති වන ඥානය වන බැවින් ප්‍රථම මාර්ග ඥානය අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය නම් වේ.

21. අඤ්ඤින්ද්‍රිය

අඤ්ඤින්ද්‍රිය අර්හත්ඵලයට පෙර ඇතිවන ඥානයයි. (අරහත්තමාර්ගය හා අරහත්ත ඵලය) අරහත්තමග්ගසමංගිස්ස ඤාණං අඤ්ඤින්ද්‍රියං. (විභංග) අඤ්ඤින්ද්‍රිය යනු සෝවාන් ඵල චිත්තයේ පටන් අර්හත්

මාර්ග චිත්තය දක්වා ඇති ලෝකෝත්තර සිත් සයෙහි ප්‍රඥාව ය. අඤ්ඤින්ද්‍රිය යන වචනයේ තේරුම දැන ගන්නා ඉන්ද්‍රිය යනු යි. සෝවාන් මාර්ගඥානයෙන් පෙර නො දන්නා ලද්ද දැන ගත්තේ වී නමුත් ක්ලේශ ප්‍රහාණ කෘත්‍යය නො නිමි බැවින් මේ ඥාන සයෙන් වරක් දැන ගන්නා ලද්ද ම නැවත නැවත බලනු ලැබේ.

22. අඤ්ඤාතාවින්ද්‍රිය

අඤ්ඤාතාවින්ද්‍රිය රහතන් වහන්සේට ඇති ඥානය, එනම් නැවත ඇති නොවන විමුක්ති ඥානයයි. අරහත්තඵලසමංගිස්ස ඤාණං අඤ්ඤාතාවින්ද්‍රියං. (විභංග) අඤ්ඤාතාවින්ද්‍රිය යනු අර්හත්ඵල චිත්තයේ ප්‍රඥාව ය. අඤ්ඤාතාවින්ද්‍රිය යන්නෙහි තේරුම දත යුත්ත දැන අවසන් කළ තැනැත්තාගේ ඉන්ද්‍රිය යන්න යි ( විශුද්ධි මාර්ගය, 2015, පි. 179 - 180 )

**දෙවිසි ඉන්ද්‍රිය පිළිබඳ වර්ගීකරණය**

දෙවිසි ඉන්ද්‍රිය ධර්ම මගින් මිනිසාගේ ශාරීරික, මානසික සහ ආත්මීය ජීවිතය තුළ ක්‍රියාත්මක වන විවිධ හැඟීම්, බලවේග, හැකියාවන් පිළිබඳ විවිධ කරුණු විස්තර වේ. මෙවැනි ව්‍යූහයක් විශේෂයෙන් අභිධර්ම පිටකයෙහි පෙන්වා දෙයි. එහි මෙම දෙවිසි ඉන්ද්‍රිය ධර්ම වර්ගීකරණය පහත ආකාරයෙන් සිදු කරයි. **පංචායතනික ඉන්ද්‍රිය (ශාරීරික ඉන්ද්‍රිය) 5ක්** මෙම ඉන්ද්‍රියන් ශාරීරික හැඟීම්වලට අදාළ වේ.

1. චක්ඛු ඉන්ද්‍රිය - ඇස (දෘශ්‍යය හැඟීමේ හැකියාව)
2. සෝත ඉන්ද්‍රිය - කණ (ශබ්දය ඇසීමේ හැකියාව)
3. ඝාණ ඉන්ද්‍රිය - නාසය (සුවඳ/දුගඳ හැඟීම)
4. ජිව්හා ඉන්ද්‍රිය - දිව (රස හැඟීම)
5. කාය ඉන්ද්‍රිය - සරිරය (ස්පර්ශ හැඟීම)

ජීවිත සහ පුරුෂ භාව තුනක්

6. මනෝ ඉන්ද්‍රිය - මනස (මනෝ විධි ක්‍රියාවන් සම්බන්ධීකරණය)
7. පුරිස ඉන්ද්‍රිය - පුරුෂ භාවය
8. ඉත්ථි ඉන්ද්‍රිය - ස්ත්‍රී භාවය

(පුරුෂ හා ස්ත්‍රී භාවය ජාති විශේෂයක හැඳින්වීමක් බවත්, තාත්ත්වික සත්‍යය බවත් සලකා බලයි.)

ජීවිත ඉන්ද්‍රිය එකක්

9. ජීවිත ඉන්ද්‍රිය - ජීවිතය රැඳවීමේ ශක්තිය (චේතසික ජීවිතය)

වේදනානුකූල ඉන්ද්‍රිය දෙකක්

10. සුඛ ඉන්ද්‍රිය සතුට/සුඛ විඳිනා හැඟීම
11. දුක්ඛ ඉන්ද්‍රිය - වේදනාව/දුක්ඛ හැඟීම
(ඉහත දෙකම ශාරීරික හැඟීම් සඳහාය)

මානසික වේදනාවන් හා සංග්‍රහය තුනක්

12. සෝමනස්ස ඉන්ද්‍රිය - මානසික සතුට
13. දෝමනස්ස ඉන්ද්‍රිය - මානසික දුක
14. උපෙක්ඛින්ද්‍රිය - මානසික උපේක්ඛාව

ආත්මීය දුරදක්නාවන් පහක්

15. සද්ධා ඉන්ද්‍රිය - විශ්වාසය (සද්ධාව)
16. විරිය ඉන්ද්‍රිය - උත්සාහය (ශක්තිමත් කර්මය)
17. සති ඉන්ද්‍රිය - සතිය (මතකය/අවබෝධය)
18. සමාධි ඉන්ද්‍රිය - මානසික ඒකත්වය (සමාධිය)
19. පඤ්ඤා ඉන්ද්‍රිය - ප්‍රඥාව (ධර්ම අවබෝධය) ( ගාමච්චි, 2006, පි. 56 )

ආර්ය මාර්ග සම්බන්ධ තුනක්

20. අනඤ්ඤාතඤ්ඤාස්සාමිතින්ද්‍රිය - අවබෝධය ලබන බව දන්නා, ක්‍රමය
21. අඤ්ඤින්ද්‍රිය - අවබෝධය ඇතිවූ, තත්ත්වය
22. අඤ්ඤාතාවින්ද්‍රිය - අවබෝධය නිමවූ, පුද්ගලයාගේ තත්ත්වය

මෙවැනි ඉන්ද්‍රිය ධර්මයන් ආර්ය මාර්ගය තුළ සමාධිය හා නිවන් අවබෝධයට බෙහෙවින් ඉවහල් වන බව පෙනේ. ඉන්ද්‍රිය යනු පාලක බලවේගයකි. එනම් මනස, හඳුනාගැනීම, හැඟීම්, විශ්වාසය, සමාධිය, ප්‍රඥාව වැනි දෑ පාලනය කරන ශක්තිමත් චෛතසික ධර්ම වේ. ( චන්දවිමල හිමි, 1990, පි. 231 )මේවා පරමාර්ථ දර්ශනයකට උපකාරී වේ. විශේෂයෙන්ම සතිපට්ඨාන භාවනාව, අෂ්ටාංගික මාර්ගය, මාර්ගඵල ධර්මය වැනි උසස් ආත්මීය ක්‍රියාවලියන්හි මේ ඉන්ද්‍රිය ධර්ම වටිනා තැනක් ගනී.

**ඉන්ද්‍රිය ධර්ම භාවනා ක්‍රමයකට සම්බන්ධවන අයුරු**

මෙම දෙවිසි ඉන්ද්‍රිය ධර්ම භාවනා ක්‍රමයකට සම්බන්ධවන අයුරු සූත්‍රවල දක්නට ඇත. දෙවිසි ඉන්ද්‍රිය ධර්ම යනු නිරවුල්ව අත්දැකීම තුළින්ම ක්‍රියාත්මක කළ යුතු ආත්මීය සංවර්ධන මාර්ගයකි. මෙය භාවනා තුළින් වඩාත් අවබෝධය ලබන, හැඩගැස්විය යුතු යුතු චෛතසික බලවේගයකි. ඉන්ද්‍රියභාවනා සූත්‍රයෙහි ඉන්ද්‍රියභාවනං භාවෙති යනුවෙන් සංයමයෙන් සන්තුෂ්ටියක් ලබාගන්නා ආකාරය පෙන්වා දෙයි. මෙය ඍජුවම ඉන්ද්‍රිය භාවනාව දැක්වෙන ප්‍රධානම සූත්‍රයයි. උපාය භාවනා සූත්‍රය අභිප්‍රේරක උපාය මාර්ග සඳහා යෙදේ.

භාවනා ක්‍රම පිළිබඳව දැක්වෙන සූත්‍ර අතර සතිපට්ඨාන සූත්‍රය විශේෂ වැදගත් ස්ථානයක් දරයි. මෙම සූත්‍රය තුළ සත්ත්වයා විසින් සිදු කළ යුතු සත්‍ය විමර්ශනය පිළිබඳව ක්‍රමවත් පදනමක් ඉදිරිපත් කෙරෙයි. මෙහි පදනම් කෙරෙන්නේ කාය, වේදනා, චිත්ත සහ ධර්මයන් පිළිබඳ සිහිය සහ නිරෝගී බව ඇති කර ගැනීමය. සතිපට්ඨාන සූත්‍රයේ ධම්මානුපස්සනාව පිළිබඳ කොටසෙහි යථාභූත දර්ශනයක් දැක්වෙයි.

පංචුපදානස්කන්ධා ධම්මාතී පජානාති... චතුහි අරියසච්චානි ධම්මාති පජානාති... සත්තා පරාජයෝ ධම්මාතී පජානාති... බෝජ්ඣඞ්ගා ධම්මාතී පජානාති... චතුස්සධා පටිපදා ධම්මාතී පජානාති. ( සතිපට්ඨාන සූත්‍රය, 2006, පි. 280 )

මෙම සූත්‍ර පාඨයට අනුව භාවනා ක්‍රමයෙහි අවසන් අදියරේදී ආත්ම වස්තුව පිළිබඳව ඉතා ගැඹුරු විමර්ශනයක් සිදු වේ. එය විධිමත් ආකාරයෙන් දැක්වෙන්නේ ඉන්ද්‍රිය භාවනා සූත්‍රය තුළිනි. එහි ඉන්ද්‍රිය ධර්ම විසිදෙක විග්‍රහ කර ඇත. ( මජ්ඣිම නිකාය, 2006, පි. 152 ) සතිපට්ඨාන සූත්‍රයෙහි විවරණය වූ චතුර්ධම්ම සත්‍ය, පංචස්කන්ධ හා බොජ්ඣඞ්ග ධර්මයන් පිළිබඳව නිරන්තර සතිය දැක්වීම තුළින් මෙම ඉන්ද්‍රිය ධර්මයන් භාවිතයෙන් විශේෂ ආත්මික ප්‍රඥාවක් වර්ධනය කෙරේ. උදාහරණ ලෙස, සද්ධා, වීරිය, සති, සමාධි, පඤ්ඤා යන පඤ්ච ඉන්ද්‍රියයන් පසක් කරමින් සතිපට්ඨාන භාවනාව ක්‍රියාත්මක වේ. වේදනානුපස්සනාවේදී සුඛ, දුක්ඛ, උපෙක්ඛා ඉන්ද්‍රියයන් නිරීක්ෂණයට ලක් කෙරේ. ධම්මානුපස්සනාවේදී චේතනා, සද්ධා, පඤ්ඤා ආදිය දැක්වෙන සන්ධාන මත භාවනාව ප්‍රගතිමත් කෙරේ. භාග්‍යවතුන් වහන්සේ ඉන්ද්‍රිය භාවනා සූත්‍රයෙහි යෝ අවිජ්ජා පරිග්ගහිතං චක්ඛු ඉන්ද්‍රියං විජානන්ති, විජ්ජා පරිග්ගහිතං ච විජානන්ති, සම්මා පජානයා පරිවෙදි ( මජ්ඣිම නිකාය, 2006, පි. 152 )යනුවෙන් පෙන්වා දෙනුයේ ඉන්ද්‍රිය ධර්මයන් නිරීක්ෂණය කරමින් ඒවා අවියජ්ජාගත හා විජ්ජාගත වශයෙන් විවරණය කළ හැකි බවය.

සතිපට්ඨාන සූත්‍රය සහ ඉන්ද්‍රිය භාවනා සූත්‍රය එක් රූපී භාවනා ක්‍රමයක අංගයන් ලෙස දැක්විය හැකි වේ. මෙහිදී විවිධ ඉන්ද්‍රිය ධර්මයන්ට සතිය, විමංසා, පඤ්ඤා යොදා නිරන්තර නිරීක්ෂණය කිරීමෙන් විපස්සනා ප්‍රඥාව වර්ධනය වන අතර නිවන් මාර්ගය විවෘත වේ. සංයුත්ත නිකායේ ඉන්ද්‍රිය සංයුත්තයේ සද්ධා වර්ගයේ ඇතුළත් සද්ධා සූත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ විසින් පංච ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳව විශේෂ විග්‍රහයක් සිදුකර ඇත ( සංයුත්ත නිකාය, 2006, පි. 48)ඉමං භික්ඛවේ සද්ධින්ද්‍රියං භාවෙතී. භාවිතං භික්ඛවේ සද්ධින්ද්‍රියං මහප්පහෝ හෝති මහානිසංසං මහානිප්පොදං. කථං භාවිතං මහප්පහෝ හොති? (සංයුත්ත නිකාය, 2006, පි. 48)යනුවෙන් සඳහන්

කරන්නේ සද්ධා ඉන්ද්‍රියය, සීලය, සුත්තාභ්‍යාසය, සති සහ පඤ්ඤාව යන ඉන්ද්‍රිය ධර්මයන් පුහුණු කිරීමෙන් ඇති වන ප්‍රතිඵලයයි. සද්ධා සූත්‍රයෙහි දෙව්සි ඉන්ද්‍රිය ධර්මයන්ට අයත් ඉන්ද්‍රිය ධර්ම පහක් දැක්වේ.

1. සද්ධින්ද්‍රියං - විශ්වාසය, ශ්‍රද්ධාව
2. විරියින්ද්‍රියං - උත්සාහය, කාර්යශක්තිය
3. සතින්ද්‍රියං - සිහිය, මානසික අවධානය
4. සමාධින්ද්‍රියං - ඒකාග්‍රතාව, මනෝසංයමය
5. පඤ්ඤින්ද්‍රියං - ප්‍රඥාව, බුද්ධිමත් අවබෝධය

මෙම ඉන්ද්‍රියයන් භාවිත කරන විට (නිසි පරිදි පුහුණු කරන විට) ඒවා නිරෝගී චිත්ත සංස්කාරයක් බිහි කරනු ඇත.

තත්‍ර කථං භික්ඛවෙ සද්ධින්ද්‍රියං භාවිතං මහප්පහො හොති? ඉධ භික්ඛවෙ අරියසාවකෝ සද්ධාසම්පන්නෝ හොති... තථාගතෙ විතරාගෙ සුප්පතිප්පන්නෙ සද්ධං ඔපන්නෙති...

මෙහි සඳහන් වන සද්ධා ඉන්ද්‍රියය නිරූපණය කරන්නේ සත්‍යයෙහි ඇති පැහැදිලි විශ්වාසයයි. ඒ තථාගතයන් වහන්සේගේ ධර්මය නිවැරදිව විශ්වාස කරන ආරිය ශ්‍රාවකයාගේ ලක්ෂණයක් ලෙස සැලකේ. සද්ධා සූත්‍රයෙහි පෙන්වා දෙනුයේ, ආරිය ශ්‍රාවකයෙකු විසින් පංච ඉන්ද්‍රියයන් සද්ධා, වීරිය, සති, සමාධි සහ ප්‍රඥා නිසි පරිදි භාවිත කරන විට එය විශාල ප්‍රතිඵලයකට හා නිවන් මාර්ගයට මඟ පෙන්වනු ලබන බවයි.

මෙම සූත්‍රයෙහි තවත් විශේෂත්වයක් වන්නේ ඉන්ද්‍රිය ධර්මයන් විභාග කිරීමේදී ඒවා භාවිතයෙන් ලැබෙන මහප්පහෝ (විශාල ප්‍රයෝජනයක්) යන සංකල්පය අවධාරණය කරන ආකාරයයි. ඉන්ද්‍රිය ධර්ම මනස හා ශරීරයට සම්බන්ධ වූ සංවේදන, ක්‍රියා සහ චේතනා වර්ග වෙයි. සද්ධා සූත්‍රය තුළින් විශේෂයෙන් පෙන්වා දී ඇත්තේ පංච ඉන්ද්‍රිය ධර්ම පිළිබඳ වන අතර මේවා විසිදෙකක් වූ ඉන්ද්‍රිය ධර්ම සමඟ සම්බන්ධතාවයක් ඇතත් ඒවා අතර වෙනස්කම් ද පවතී. සද්ධා සූත්‍රයේ සඳහන් පංච ඉන්ද්‍රිය ධර්ම ආරිය මාර්ගයේ භාවනාකරණයේ

මූලික මනෝබල මෙන්ම පුහුණු කළ යුතු මනසික ක්‍රියාවන් ලෙස පෙන්වා දී තිබේ.

විසිදෙකක් වූ ඉන්ද්‍රිය ධර්මයන් මඟින් ශරීරය හා මනස තුළ ඇති සංවේදන හා ක්‍රියා මෙන්ම මනෝචිත්තයේ මූලික තත්ත්වය දැක්වීම සිදුවෙයි. සද්ධා සූත්‍රයේ පංච ඉන්ද්‍රිය ධර්ම මඟින් එම මූලික සංවේදන මෙන්ම ඒවායේ මනෝබලය, ශක්තිය හා ප්‍රඥාව වැනි ගුණාංග නිපුණව භාවිත කිරීමට උපකාරී වන මනෝමය අංගයන් වේ. (ගාමච්චි, 2006, පි. 34 )වෙනස වන්නේ විසිදෙක ඉන්ද්‍රිය ධර්ම ශරීර හා මනස තුළ සිදු වන සංවේදන ක්‍රියා හා චේතනාවල විධිමත් ලෙස වර්ගීකරණය කිරීමක් වන අතර සද්ධා සූත්‍රයේ පංච ඉන්ද්‍රිය ධර්ම එම සංවේදන හා ක්‍රියා නිසි පරිදි පුහුණු කර ජීවිතයේ නිවන් මාර්ගයට යොමු කරන මනෝබල සංස්කාර කෙරෙහි අවධානය යොමු කරයි.

ඒ අනුව සද්ධා සූත්‍රයේ පංච ඉන්ද්‍රිය ධර්ම නිවැරදි මනෝභාව ප්‍රගතිශීලී භාවනාවට මූලික වන අතර දෙවිසි ඉන්ද්‍රිය ධර්ම මඟින් ශරීර හා මනස තුළ ඇති ප්‍රතිචාර හා ක්‍රියාකාරකම් මූලික වශයෙන් විවරණය කරයි. එබැවින් මේ දෙක සමාන්තරව පැවතියත් සද්ධා සූත්‍රයේ ඉන්ද්‍රිය ධර්ම ප්‍රායෝගික භාවනාවට හා ජීවිත සංවිධානයට මඟපෙන්වීමක් ලෙස වැදගත් වේ. ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳ සම්පූර්ණ අවබෝධය මඟින් ආර්ය මාර්ගයේ නිවැරදි පුහුණුව දියුණු කරගැනීම මඟින් නිවන් ප්‍රාප්තියේ මාර්ගය පැහැදිලිව දැන ගැනීමට ඉවහල් වේ. ඉන්ද්‍රිය යන වචනයෙන් අදහස් කරන්නේ ජීවියෙහි අතුරු මාර්ග හෝ කේන්ද්‍රය වන ඉන්ද්‍රියයි. බෞද්ධ මතයට අනුව මනුෂ්‍යයාගේ මනස හා ශරීරය හරහා ලොව හා සම්බන්ධ වීමේ මාර්ගයන් වූ ඉන්ද්‍රිය ධර්ම 22ක් පෙන්වා දෙයි. මෙය සම්පූර්ණයෙන්ම මනෝවිද්‍යාත්මක හා භාවනාත්මක වශයෙන් සලකා බැලීමක් ලෙසද හැඳින්විය හැක. චුල්ල නාමක සූත්‍රයේ දෘශ්‍ය ආශ්‍රිතව මනසට පැමිණෙන චේතනා තත්ත්වයන් තුනක් වර්ගීකරණය කොට පෙන්වා දෙයි.

1. දෘෂ්ඉන්ද්‍රියය
2. දෘෂ්ඉන්ද්‍රියට සම්බන්ධ දෘශ්‍ය වස්තුව
3. සහ ඒ දෙකම සම්බන්ධයෙන් ඇති දෘශ්‍ය විඥානය යන ත්‍රිත්වයයි.

මෙම ත්‍රිත්වය ඉන්ද්‍රිය වර්ගීකරණයේ මූලික දර්ශනයකි. ඉන්ද්‍රිය ධර්ම මඟින් මනස සහ ශරීරයේ හැසිරීම විවේචන සහ ප්‍රතික්‍රියා අතර සම්බන්ධතාවය හොඳින් අවබෝධ කර ගැනීමට උපකාරී වේ.

1. ඇස, කන, නාසය, දිව හා ස්පර්ශයෙන් ලෝකය පිළිබඳ විවිධ තොරතුරු ලැබෙයි.

2. මනස ඒ තොරතුරු එකතු කර විවෘත මනෝභාවයක් ගොඩනගයි.

3. එම මනෝභාවය අනුව අපගේ හැසිරීම්, චින්තන හා ක්‍රියාවන් සකස් වේ.

ඉන්ද්‍රිය ධර්මයන් දේශනා කිරීමෙන් බුදුරජාණන් වහන්සේ අපේක්ෂා කළේ මෙම සියලු ක්‍රියාවන් සම්බන්ධයෙන් ඇතිවන ලෝක ආකර්ෂණ හා විරෝධතා නිසා ඇතිවන බිය සහ ලෝභ දුරු කිරීමයි. ඉන්ද්‍රිය ධර්ම මඟින් මනස හා ලෝකය අතර සම්බන්ධතාවය සම්පූර්ණයෙන්ම විග්‍රහ කරයි. එම නිසා බෞද්ධ භාවනාවේ මූලික කොටසක් ලෙස ඉන්ද්‍රිය ධර්ම විසිදෙක හඳුනා ගැනීම හා ඒ පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. පෙළ අටුවාවන් සම්පූර්ණයෙන්ම කරුණු නිරූපණය කරන්නේ හේතු සම්බන්ධතා මගින්ය.

"නාමරූප උපාදානං ආයතනං" නම - රූප (මනස සහ ශරීරය) හේතුවෙන් ඉන්ද්‍රිය අතර සම්බන්ධතාවය උපදියි.

බෞද්ධ දර්ශනයේ ඉන්ද්‍රිය මඟින් සංවේදන හා දැනීම සිදු වන අතර, එම ඉන්ද්‍රිය සෘජුවම පාලි අටුවාවන් තුළින් සාළායතන හා සම්බන්ධ වේ. සාළායතන මඟින් ලෝක දැනීමේ මධ්‍යස්ථාන හයක් වන අතර, එම මධ්‍යස්ථාන හරහා සංවේදන, වේදනාව, ආසාව ආදී ක්‍රියාවන් සක්‍රීය වෙයි. ඉන්ද්‍රිය මැනවින් පාලනය සහ අවබෝධය මඟින් ඉන්ද්‍රියන්හි අස්ථිරත්වය, ආසාවන් හා බැඳීම අවසන් කර නිර්වාන සම්ප්‍රාප්තියට මඟ සකසයි. ඉන්ද්‍රිය හය (සංවේදී හැඟීම් මධ්‍යස්ථාන) සංසාර චක්‍රයේ මූලික ස්ථානයක් ගනී. ඒවා පාලි අටුවාවන්හි සාළායතන අටුවාව

ලෙස හැඳින්වෙයි. ඉන්ද්‍රිය හරහා සිදු වන සම්පර්කය, වේදනාව සහ ආසාවන් මඟින් භවය (සංසාරය) පවත්වාගෙන යයි. ඉන්ද්‍රිය පාලනය මඟින් සංසාර බැඳීම් අවසන් කර නිවන් සම්ප්‍රාප්තිය ලඟා කර ගත හැක.

ඉන්ද්‍රිය ධර්මයන් යනු සත්වයාගේ පැවැත්මට හා අධ්‍යාත්මික දියුණුවට මූලික වන බලවේග වේ. මේවා නිසි ලෙස වටහාගෙන යෝනිසෝ මනසිකාරයෙන් යුතුව භාවිත කිරීමෙන් දුකින් මිදීමට මාර්ගය විවෘත වේ. පංච ඉන්ද්‍රියන් (ඇස, කන, නාසය, දිව, ශරීරය) සහ මනස යන ඉන්ද්‍රියන් හරහා අප ලෝකය අත්විඳින ආකාරය පැහැදිලි කරයි. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සහ ධර්ම යන අරමුණු මෙම ඉන්ද්‍රියන්ට අනුව පිළිගැනේ. මෙමඟින් අපගේ සංවේදන ක්‍රියාවලිය හා ලෝක දෘෂ්ටිය ගොඩනැගෙන ආකාරය අවබෝධ කරගත හැකිය. පංච ඉන්ද්‍රියන්ගෙන් අප ලෝකය අත්විඳින ආකාරය පෙන්වා දෙන අතර වේදනාව සංඥාව හා සංස්කාර හටගැනීමට මෙය මූලික වන බව අවධාරණය කරයි.

සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සෝමනස්සින්ද්‍රිය, දෝමනස්සින්ද්‍රිය සහ උපෙක්ඛින්ද්‍රිය යන වේදනා ඉන්ද්‍රියන් මඟින් ජීවිතයේ අත්විඳින සැප, දුක, සතුට, නොසතුට සහ උපේක්ෂාව වැනි මානසික හා ශාරීරික හැඟීම්වල ස්වභාවය පෙන්වා දෙයි. මෙමඟින් වේදනාවන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව අවබෝධ කර ගැනීමටත්, ඒවාට ඇලීමෙන් වැළකීමටත් හැකියාව ලැබේ. "සබ්බේ සංඛාරා දුක්ඛාති යදා පඤ්ඤාය පස්සති, අථ නිබ්බින්දති දුක්ඛේ, ඒස මග්ගෝ විසුද්ධියා." සියලු සංස්කාර දුක්ඛ බව යම් කලෙක ප්‍රඥාවෙන් දකී ද, එකල්හි දුකින් කලකිරෙයි, මේ පිරිසිදු වීමේ මාර්ගයයි. ඉන්ද්‍රියන් මඟින් අත්විඳින සියලු වේදනාවන් දුකෙහි ස්වභාවය ගන්නා බව අවබෝධ කර ගැනීමෙන්, ඒවා කෙරෙහි ඇති ඇලීම නැති කර නිවනට මඟ පැදේ. සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන ඉන්ද්‍රියන් පංච බලයන් ලෙස ද හඳුන්වනු ලබන අතර, ඒවා අධ්‍යාත්මික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය වේ. නිවැරදි ශ්‍රද්ධාව, වීර්යය, සතිය, සමාධිය සහ ප්‍රඥාව වැඩීමෙන් සිත කෙලෙස්වලින් මුදවා ගත හැකිය. මෙම පංච ඉන්ද්‍රියන් සමබරව වර්ධනය කිරීමෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය

සම්පූර්ණ කර නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට හැකි වේ. මේවා භාවනාවේදී සිත දියුණු කිරීමටත් නීවරණ යටපත් කිරීමටත් මූලික වේ.

අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය සහ අඤ්ඤාතාවින්ද්‍රිය යන ඉන්ද්‍රිය ත්‍රිත්වය ආර්ය මාර්ගඵල අවබෝධය හා බැඳී පවතී. සෝවාන් මාර්ගයට පිවිසීමට පෙර ඇතිවන ඥානය, රහත් මාර්ගයේදී ඇතිවන ඥානය සහ රහතන් වහන්සේට ඇති වන විමුක්ති ඥානය මෙයින් නිරූපණය කෙරේ.

මෙය නිවනට පියවරෙන් පියවර ළඟා වන ආකාරය පෙන්වා දෙයි. "සෝතාපත්තිමග්ගඤාණං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, අරහත්තමග්ගඤාණං අඤ්ඤින්ද්‍රියං, අරහත්තඵලඤාණං අඤ්ඤාතාවින්ද්‍රියං" (අභිධම්මාර්ථ සංග්‍රහ) සෝවාන් මාර්ග ඥානය අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයි, අරහත් මාර්ග ඥානය අඤ්ඤින්ද්‍රියයි, අරහත් ඵල ඥානය අඤ්ඤාතාවින්ද්‍රියයි. මෙය මාර්ගඵලාවබෝධයේ ප්‍රගතිය විදහා දක්වන අතර නිර්වාණාවබෝධය සඳහා අවශ්‍ය ප්‍රඥාවේ විවිධ අවස්ථා පෙන්වා දෙයි.

ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳ මනා අවබෝධය, අවිද්‍යාව දුරු කිරීමට මඟ පෙන්වයි. ඉන්ද්‍රියන්ගේ යථා ස්වභාවය ඒවායේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව අවබෝධ කර ගැනීමෙන් සත්වයාට ඇති ආත්ම දෘෂ්ටිය හා සක්කාය දිට්ඨිය දුරු කරගත හැකිය. "සබ්බේ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති, අථ නිබ්බින්දති දුක්ඛේ, ඒස මග්ගෝ විසුද්ධියා"( ධම්මපදය, 2018, පි. 58 )සියලු ධර්ම අනාත්ම බව යම් කලෙක ප්‍රඥාවෙන් දකී ද එකල්හි දුකින් කලකිරෙයි මේ පිරිසිදු වීමේ මාර්ගයයි. ඉන්ද්‍රියන්ද අනාත්ම වේ. ඒවා තමාගේ යැයි අල්ලා ගත නොහැකි බව අවබෝධ කර ගැනීමෙන් සසර දුකින් මිදීමට මාර්ගය විවෘත වේ.තිලකරත්න, 2001, පි. 58 මෙසේ ඉන්ද්‍රිය ධර්ම විසිදෙක බෞද්ධ දර්ශනයෙහි ගැඹුරු අර්ථයක් දරයි. ඒවා පුද්ගලයාගේ සංසාර චක්‍රය පවත්වාගෙන යන ආකාරයත් එයින් මිදීමට ඇති මාර්ගයත් පැහැදිලි කරයි. මෙම ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳ මනා අවබෝධය, විදර්ශනා භාවනාව ප්‍රගුණ කිරීමට මූලික පදනම සපයන අතර සසර

දුකින් මිදී නිර්වාණාවබෝධයට මඟ පෙන්වයි.

## සමාලෝචනය සහ නිගමනය

තමා හා සම්බන්ධ ධර්මයන් කෙරෙහි අධිපතිකම පවත්වන දේ (ධර්මයෝ) ඉන්ද්‍රිය නම් වෙති. අධිපතිකම පැවැත්වීම යනු තමාට අනුකූල කරවා ගැනීම ය. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලින් නිර්දේශිත පරම නිෂ්ඨාව වන නිර්වාණය අවබෝධ කිරීම සඳහා ඉන්ද්‍රිය සංවරය අත්‍යවශ්‍ය වෙයි. ඉන්ද්‍රිය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි ව්‍යුහාත්මක සන්දර්භ කිහිපයක් ඇති බව පෙනේ.

බුදුරජාණන් වහන්සේ විසින් සෑම අරමුණක් සඳහාම ප්‍රධාන වන්නාවූ ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පඤ්චේන්ද්‍රියන්ට අමතරව එය විශ්ලේෂණය කරමින් ඉන්ද්‍රියන් 22ක් දක්වා ඇත. දෙවිසි ඉන්ද්‍රිය ධර්ම යනු නිරවුල්ව අත්දැකීම තුළින්ම ක්‍රියාත්මක කළ යුතු ආත්මීය සංවර්ධන මාර්ගයකි. බෞද්ධ භාවනාවේ මූලික කොටසක් ලෙස ඉන්ද්‍රිය ධර්ම විසිදෙක හඳුනා ගත හැකි වෙයි. පෙළෙහි විවිධ අවස්ථාවන්හි මෙම කරුණු ඉස්මතු කොට ඇති අතර ඒවා පිළිබඳව පුළුල් ලෙස අධ්‍යයනය නිර්වාණ සාධානයට අවශ්‍ය මඟ පෙන්වයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ප්‍රාථමික මූලාශ්‍රය

අංගුත්තර නිකාය i, (2006). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

අංගුත්තර නිකාය ii, (2006). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

දීඝ නිකාය i, (2006). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

මජ්ඣිම නිකාය i, (2006). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

සංයුත්ත නිකාය i, (2006). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

සුත්ත නිපාතය, (2006). බුද්ධ ජයන්ති මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

ද්විතීයික මූලාශ්‍රය

අග්ගවංස හිමි, මුල්ඇඩියාවල. (2015). බෞද්ධ දර්ශනාගත මනෝමය පඤ්චේන්ද්‍රිය විවරණය, බෞද්ධ මනෝවිද්‍යාව, (සංස්:) ඒ.එස්. කළුආරච්චි, මාගධී. පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය, මිරිස්වත්ත, පුවක්පිටිය

තිලකරත්න, හේ. මු., ජයතිලක, කේ. එන් (2001). දර්ශනය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

ධම්මානන්ද හිමි, හෝමාගම. (2001). දාර්ශනික ඥාන විභාගය පිළිබඳ බෞද්ධ විග්‍රහය, සම්භාෂා *11 වැනි කලාපය : විද්‍යාලංකාර 125* සමරු *ශාස්ත්‍රීය* සංග්‍රහය, (සංස්)ජී. ඩී. රත්නපාල, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය, බත්තරමුල්ල.

ධර්මසිරි, ජී. (2006). දාර්ශනික ප්‍රශ්න, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

රාහුල හිමි, හෙට්ටිමුල්ලේ. (2002), මුල් බුදුසමයේ එන ඥාන විභාගයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ, සම්භාෂා *12 වැනි කලාපය : ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර* සමාගමේ *ශත* සංවත්සර සමරු *ශාස්ත්‍රීය* සංග්‍රහය, පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, බත්තරමුල්ල.

රත්නායක, සුමන. (2004). මූලික බුදුසමයේ ඉගැන්වෙන ප්‍රපඤ්චනය හා ප්‍රපඤ්ච නිරෝධය, සාරගවේසී ශාස්ත්‍රීය සංග්‍රහය, (සංස්:) තල්ගම්පල සිරි පදුම හිමි, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය.

විශුද්ධිමාර්ගය (2015). (සංස්.) නිවන්දගම ධර්මකීර්ති හිමි බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

සෝරත හිමි, පොල්ලමුරේ. (1999). මහා සතිපට්ඨාන සූත්‍රයේ ප්‍රායෝගික අංශය පිළිබඳව විග්‍රහයක්, *උපසර ආනන්ද කුලසූරිය උපහාර,* (සංස්.) පියසීලී විජේමාන්න, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.